# පටුන


පටුන....1

පූර්විකාව....2

විධායක වාර්තාව....3

හැඳින්වීම....4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය....5

දැක්ම....5

මෙහෙවර....5

සංවිධාන සැලැස්ම....6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2014....7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2014....8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2014....9

2014 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය....11

වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම.....11

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන් - 2014....12

වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2014....13

රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2014....14

රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2014....14

දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම - 2014....15

ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන....16

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන....17

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු-2014....20

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය....21

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය....22

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති....24

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව....25

ආදායම් සහ වියදම් වාර්තාව....26

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය....27

උප ලේඛන....28

විගණකාධිපතිගේ මතය....31

විගණකාධිපති වාර්තාව....32

විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු....39

# පූර්විකාව

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමාජ සේවා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ උන්නතිය උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය තීරණ උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව සකස් කරයි.

2014 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2014 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාවේ අරමුණයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව 2014 වර්ෂයේදී වැඩිහිටි ආත්මාභිමානය, ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණය ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර වඩාත් ඵලදායී සේවාවක් ඉටු කිරීමට ලැබීමද වාසනාවකි.

තවද මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළින් ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම උදෙසා අතීත උරුමයේ කොටස්කරුවන් වූ වැඩිහිටියන් අතරින් අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් දහසක ප්‍රධානයක් ලබා දෙමින් තෘප්තිමත් වැඩිහිටිවියක් උදෙසා කැපවීම සතුටට කරුණකි.

# විධායක වාර්තාව

2014 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය උදෙසා කැපවී ක්‍රියා කළ අතර ඒ නිසාම 2014 වසරේ සැලසුම් කළ පරිදිම සාර්ථක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වැඩසටහන් අතර මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දහසක ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර අභියෝග ජය ගැනීමට ගරු සමාජ සේවා අමාත්‍යතුමාගේත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් මඟ පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යයමණ්ඩලය මේ පිළිබඳව දක්වන උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය ද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තුතිය හිමි විය යුතුය.

# හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදුවූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 12.2% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 22% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුහසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි. 2014 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව බලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


## දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායී වැඩිහිටි දිවියක් උදාකිරීම


## මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්මපරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

# සංවිධාන සැලැස්ම


වැඩිහිටි තැනැත්තන් සඳහා
වූ ජාතික සභාව
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
අධ්‍යක්ෂ
(1)
සහකාර අධ්‍යක්ෂ
(සංවර්ධන) (1)
සහකාර අධ්‍යක්ෂ
(පරිපාලන) (1)
නීති නිලධාරී (1)
ගණකාධිකාරී (1)
පරිපාලන නිලධාරී (1)
වැඩිහිටි හිමිකම්
ප්‍රවර්ධන සහකාර - 98
වැඩිහිටි හිමිකම්
ප්‍රවර්ධන සහකාර - 2
කළමනාකරණ
සහකාර (1)
කළමනාකරණ
සහකාර (2)
කළමනාකරණ
සහකාර (1)
කළමනාකරණ
සහකාර (2)
රියදුරු (2)
කා.කා.ස (1)
කා.කා.ස (1)
කා.කා.ස (1)

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2014




| නම | තනතුර |
|---|---|
| 1. ඉමෙල්ඩා සුකුමාර් මිය | සභාපති |
| 2. සමන් උඩවත්ත මයා | උප සභාපති |
| 3. සුවින්ද.එස්.සිංගප්පුලි මයා | ලේකම් |
| 4. අනූෂා ගෝකුළ ප්‍රනාන්දු මිය | කමිටු සාමාජික |
| 5. ආචාර්ය ලීල් ගුණසේකර මයා | කමිටු සාමාජික |
| 6. කේ.ඩී.සී.එස්.චන්ද්‍රරත්න මයා | කමිටු සාමාජික |
| 7. පියසිරි බණ්ඩාරනායක මයා | කමිටු සාමාජික |
| 8. වෛද්‍ය ඩබ්ලිව්.එල්.එල්.යූ.සී කුමාරතිලක මහත්මිය | කමිටු සාමාජික |
| 9. ඒ.ඇබ්ඩන් සිල්වා මයා | කමිටු සාමාජික |
| 10. පී.පී.එච්.ඒ මහේන්ද්‍ර සිල්වා මයා | කමිටු සාමාජික |
| 11. දිනේෂ් වී.ප්‍රනාන්දු මයා | කමිටු සාමාජික |
| 12. රිඩ්ලි ජයසිංහ මයා | කමිටු සාමාජික |
| 13. ආචාර්ය ප්‍රේමසිරි ගමගේ මයා | කමිටු සාමාජික |
| 14. කේ.ජී.කේ විමලවීර මයා | කමිටු සාමාජික |
| 15. කමල් අමරසිංහ මයා | කමිටු සාමාජික |
| 16. ආචාර්ය නීලා පියසීලී ගුණසේකර මහත්මිය | කමිටු සාමාජික |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2014

ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන විවිධ සමාජ ආර්ථික ගැටළු හා ප්‍රශ්න අතර මෙරට වැඩිහිටි ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම, සුවිශේෂී ගැටළුවක් වී ඇත. එහෙයින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පැවරෙන සමාජ වගකීම ද දිනෙන් දින වර්ධනය වන බවක් පෙනෙන්නට තිබෙන හෙයින්, අපගේ වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා කාලීනව උපාය මාර්ගික සැලසුම්කරණ හා ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවේ.

ඒ අනුව ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවට නගමින් පෙර වර්ෂවලට වඩා පුළුල් ජාතික මෙහෙවරක් 2014 වර්ෂයේ ඉටු කරන්නට ලැබීම බලවත් වූ සතුටට කරුණකි.

එහිදී වගකීමෙන් යුතුව සුවිශාල කාර්යභාරයක් ඉටු කරන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සියළුම සාමාජිකයන් මෙන්ම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්යය මණ්ඩලය හා වැඩිහිටි නඩත්තු මණ්ඩලය ද පැසසුමට ලක් විය යුතුය.

එසේම වැඩිහිටියන්ගේ සුභසාධනය හා ඔවුන්ගේ රැකවරණය සැපයීමේ කාර්යයේදී නන් අයුරින් සහය වූ රාජ්‍ය නොවන සංවිධානවලට ද මාගේ කෘතඥතාවය පළ කරමි.

**ඉමෙල්ඩා සුකුමාර්**
ලේකම්
සමාජ සේවා අමාත්‍යාංශය
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2014

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

**1. රු. 1000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව**

මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ වයස අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය සහ සුභසාධනය සැලසීමේ අරමුණින් 2014 අයවැය යෝජනා යටතේ වැඩිහිටි සුභසාධනය සඳහා අතිරේක ප්‍රතිපාදන රජය විසින් වෙන් කර දෙන ලදී.

වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 242842 කට පමණ 2014 වර්ෂයේදී රු. 1000/- දීමනාව ලබා දී ඇත.

**2. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූල්‍යාධාර සැපයීම.**

ග්‍රාමීය වැඩිහිටි කමිටු 1012 ක් ද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 36ක් ද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 04 හා පලාත් වැඩිහිටි බලමණ්ඩල 01ක් සඳහා රුපියල් මිලියන 5**.492** ක මූල්‍යාධාර ලබාදී ඇත.

**3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

වර්ෂය තුළ රුපියල් මිලියන 0.511 ක වියදමක් දරා වැඩිහිටියන් 12811 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

**4. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම.**

2014 වර්ෂය තුළ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 79 ක් සඳහා රුපියල් මිලියන 1.98 ක මුදලක් ලබාදී ඇත.

**5. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

ප්‍රාදේශීය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 278 ක් දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 22 ක් සහ පලාත් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් ද සඳහා රුපියල් මිලියන **5.492** ක මුදලක් වැය කර ඇත**.**

**6. නොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම.**

2014 වර්ෂය තුළ වැඩිහිටියන් 3573 දෙනෙකුට වෛද්‍ය නිර්දේශයන්ට අනුව අක්ෂිකාච නිකුත් කර ඇති අතර, 133 දෙනෙකුට ශ්‍රවණ උපකරණ ලබා දී තිබේ. වැය වූ මුදල රුපියල් මිලියන 8**.475** කි.

**7. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"කිසිවෙකු අත නොහරින එකම එක සමාජයක්" යන තේමාව යටතේ 2014 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2014.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන් පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන්නට යෙදුන අතර, ඒ සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 7.**254** කි.

***8.* වැඩිහිටි නිවාසවලට මූලාධාර ලබාදීම.**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය සහ සංචාරක නිකේතනය සංවර්ධනය කිරීම් ද ඇතුලත්ව වැඩිහිටි නිවාස සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2.168 ක මුදලක් වැයකර තිබේ.

**9. වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන**

දානපතියන්ගේ පරිත්‍යාග තුළින් 2014 වර්ෂයේදී එක් අයෙකුට මසකට රු. 250/- ක් වන පරිදි වැඩිහිටියන් 51 දෙනෙකුට අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

**10. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලය 45 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගේ පැමිණිලි 170 ක් අතරින් පැමිණිලි 133 ක් විසඳා අවසන් කරන ලදී. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2014 වර්ෂයේදී රුපියල් මිලියන 0.**99** ක් වැය කොට ඇත.

**11. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

2014 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 07 ක් පවත්වා ඇත. වැයවූ මුදල රුපියල් මිලියන 0.**418** කි.

2014 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 20 ක් ද පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 90 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 19.**1** ක් හා රු. මිලියන 81.**4** පමණි. කෙසේ නමුත්, 2014 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 74.**3** ක මුදලක් ද ප්‍රාග්ධන වියදම් යටතේ රු. මිලියන 17.**7** ක් වැඩිහිටි සුබසාධන කටයුතු සඳහා සෘජුව වැය කර ඇත.

සුචින්ද.එස්.සිංගප්පුලි
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# 2014 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

## වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම.

| දිස්ත්‍රික්කය | වැඩිහිටි නිවාසය | ගෙවන ලද මුදල (රු) |
|---|---|---|
| මොණරාගල | කතරගම සංචාරක නිකේතනය | 2,167,250.17 |
| | කතරගම වැඩිහිටි නිවාසය | 750,363.22 |
| මන්නාරම | සාන්තෝම් වැඩිහිටි නිවාසය | 730,514.00 |
| යාපනය | කයිතඩි වැඩිහිටි නිවාසය | 2,000,000.00 |
| **එකතුව** | | **5,648,127.44** |

## වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන් - 2014

| පළාත | දිස්ත්‍රික්කය | හැඳුනුම්පත් සංඛ්‍යාව | මුදල |
|---|---|---|---|
| බස්නාහිර | කළුතර | 765 | රු.15 300/- |
| | ගම්පහ | 385 | රු. 7700/- |
| මධ්‍යම | මාතලේ | 1462 | රු.29 240/- |
| | මහනුවර | 1032 | රු.21 955/- |
| දකුණ | හම්බන්තොට | 1276 | රු.26 395/- |
| නැගෙනහිර | මඩකලපුව | 45 | රු.900/- |
| වයඹ | කුරුණෑගල | 1573 | රු.32 240/- |
| උතුරු මැද | අනුරාධපුර | 175 | රු.3809/- |
| | පොළොන්නරුව | 323 | රු.6460/- |
| ඌව | බදුල්ල | 3756 | රු.74 745/- |
| සබරගමුව | රත්නපුර | 451 | රු.9020/- |
| උතුර | යාපනය | 69 | රු.1340/- |
| | වවුනියාව | 330 | රු.6600/- |
| **එකතුව** | | 12 811 | **රු.260 179/-** |

### වෙනත් වියදම්

| විස්තරය | වියදම(රු) |
|---|---|
| කාඩ් ලැමිනේටින් | 244 713.75 |
| මුද්‍රණ | 6720.00 |
| **එකතුව** | **251 433.75** |

## වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5000 ආධාර ලබාදීම - 2014

| පළාත | දිස්ත්‍රික්කය | රු 5000 ආධාර ලබාදුන් කමිටු සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 51 |
| | කොළඹ | 31 |
| | ගම්පහ | 130 |
| මධ්‍යම | මහනුවර | 76 |
| | මාතලේ | 39 |
| | නුවරඑළිය | 32 |
| දකුණ | ගාල්ල | 31 |
| | මාතර | 34 |
| | හම්බන්තොට | 13 |
| උතුර | යාපනය | 40 |
| | වවුනියාව | 14 |
| | කිලිනොච්චි | 04 |
| | මන්නාරම | 04 |
| | මුලතිව් | 02 |
| නැගෙනහිර | මඩකලපුව | 65 |
| | අම්පාර | 49 |
| | ත්‍රිකුණාමලය | 14 |
| වයඹ | පුත්තලම | 72 |
| | කුරුණෑගල | 157 |
| සබරගමුව | රත්නපුර | 40 |
| | කෑගල්ල | 26 |
| ඌව | මොණරාගල | 07 |
| | බදුල්ල | 10 |
| උතුරු මැද | අනුරාධපුර | 44 |
| | පොළොන්නරුව | 26 |
| ***එකතුව*** | | **1012** |

## රු. 7500 මුල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල - 2014

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 02 |
| | ගම්පහ | 02 |
| දකුණ | ගාල්ල | 02 |
| | මාතර | 01 |
| | හම්බන්තොට | 01 |
| සබරගමුව | රත්නපුර | 02 |
| උතුර මැද | අනුරාධපුරය | 01 |
| මධ්‍යම | මහනුවර | 03 |
| | මාතලේ | 03 |
| ඌව | බදුල්ල | 01 |
| වයඹ | කුරුණෑගල | 02 |
| | පුත්තලම | 04 |
| නැගෙනහිර | මඩකලපුව | 01 |
| | අම්පාර | 01 |
| එකතුව | | 36 |

## රු. 15000 මුල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල - 2014

| පළාත | දිස්ත්‍රික්කය | බලමණ්ඩල ගණන |
|---|---|---|
| බස්නාහිර | කළුතර | 01 |
| උතුර මැද | අනුරාධපුරය | 01 |
| දකුණ | හම්බන්තොට | 01 |
| නැගෙනහිර | මඩකලපුව | 01 |
| එකතුව | | **04** |

## දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම - 2014

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | උපකරණ මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම | |
|---|---|---|---|---|
| | | | මධ්‍යස්ථාන සංඛ්‍යාව | මුදල රු |
| බස්නාහිර | කළුතර | කළුතර | 06 | 150,000/- |
| | කොළඹ | කොළඹ | 01 | 25,000/- |
| | | කැස්බෑව | 01 | 25,000/- |
| | | පාදුක්ක | 01 | 25,000/- |
| දකුණ | ගාල්ල | හබරාදූව | 01 | 25,000/- |
| | | අම්බලන්ගොඩ | 01 | 25,000/- |
| | | ඇල්පිටිය | 02 | 49,480/- |
| | හම්බන්තොට | බෙලිඅත්ත | 02 | 50,000/- |
| | | ඕකේවෙළ | 01 | 25,000/- |
| සබරගමුව | කැගල්ල | කැගල්ල | 02 | 48,399/- |
| | | යටියන්තොට | 05 | 125,000/- |
| මධ්‍යම | මහනුවර | මැදදුම්බර | 01 | 25,000/- |
| | | යටිනුවර | 01 | 25,000/- |
| ඌව | බදුල්ල | සොරණාතොට | 01 | 25,000/- |
| | | හපුතලේ | 01 | 25,000/- |
| වයඹ | පුත්තලම | පුත්තලම | 02 | 49,640/- |
| | කුරුණෑගල | පොල්ගහවෙල | 02 | 50,000/- |
| | | කොටවෙහෙර | 02 | 50,000/- |
| | | පඬුවස්නුවර බටහිර | 16 | 400,000/- |
| | | මාස්පොත | 03 | 75,000/- |
| | | වීරම්බුගෙදර | 03 | 75,000/- |
| | | වනාතවිල්លු | 09 | 225,000/- |
| | | උඩුබද්දාව | 05 | 125,000/- |
| | | පන්නල | 04 | 100,000/- |
| | | ආරච්චිකට්ටුව | 02 | 50,000/- |
| නැගෙනහිර | අම්පාර | කල්මුනෙයි | 01 | 25,000/- |
| | ත්‍රිකුණාමලය | කින්නියා | 03 | 75,000/- |
| | | කන්තලේ | 01 | 25,0000/- |
| **එකතුව** | | | 79 | 1,972,519/- |

## ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාර සේවා ලබාදීමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරා ගන්නා ලද 135ක පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳ සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විට විශේෂයෙන්ම බස්නාහිර පළාත තුල ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබා ගැනීමට මාහැඟි අවස්ථාවක් උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු.750.00 බැගින් ද රාත්‍රි වැඩමුරයකට රු.900.00 බැගින් ද හා පැය 24 ක වැඩමුරයකට රු.1650.00 ක නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි කාන්තා හෝ පිරිමි සේවාදායකයකු ලබාගත හැක. එසේම සේවයේ යොදවන සියළු වැඩිහිටි සත්කාරකයන් ආචාරධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.
සමාජ සේවා අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැළසුම්කර මෙහෙයවන අතර පුහුණුව සාර්ථකව අවසන් කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වෙච්ඡා සේවකයන්ගේ සේවය තුළින් ලබා ගැනීමට හැකි වී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයෙකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකි වීම නිසා වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවක පුහුණුව ලැබූවන්හටද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වෙච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත්වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටියන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස් කර තිබේ.

## වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 4 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී/සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදිමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිමට කැමති අයෙකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.
මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහගු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2014 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

| අංකය | දායකයාගේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභියාගේ නම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|
| 1 | අනුෂා ගෝකුල ප්‍රනාන්දු මිය | 07 | ඒ.හේමමාලා පෙරේරා මිය | මහරගම |
| | | | එම්.ඒ.පීටර් පෙරේරා මයා | මහරගම |
| | | | ඩබ්.ඩී.ධර්මදාස මයා | මහරගම |
| | | | ජී.තෙරේසා ඩිලෙක්, | කැලණිය |
| | | | එච්.විනී ප්‍රනාන්දුමයා | පානදුර |
| | | | ජේ.ඒ. විනිප්‍රීඩා පෙරේරා, | කළුතර |
| | | | ඒ. ජී. ධර්මවර්ධන මයා | දැරණියගල |
| 2 | පී.කේ.එස්.සුභෝධිනී මෙනවිය | 1 | එම්.පී. ලිලීමිය | කැලණිය |
| 3 | එච්.බී. තම්තේගම මහතා | 08 | ආර්.ඒ. කරලියන්නෝනාමිය | මිහින්තලේ |
| | | | ඩබ්. පී. ලීලාවතීමිය | තිස්සමහාරාමය |
| | | | එච්.එම්.හේරත්මැණිකේ | ඉබ්බාගමුව |
| | | | ඩී.එම්.ඩිංගිරිඅම්මාමිය | මාස්පොත |
| | | | ඩබ්.පී. ගුණවති මිය | කුණ්ඩසාලේ |
| | | | බී.ඩී. ජේන්නෝනාමිය | රිදීගම |
| | | | ආර්.පී.ඩී. උක්කු මිය, | පඩුවස්නුවර/බ |
| | | | ටී.ඩබ්.පී. අංගෝමිය | මාවනැල්ල |
| 4 | එස්.ඒ. හින්ට්ඩ් මහත්මිය | 8 | පී.ආර්.සාදිනෝනා මිය | වරකාපො |
| | | | අයි.පී. සොයිදාමිය | වරකාපොල |
| | | | එම්.පී. පොඩිනෝනාමිය | වරකාපොල |
| | | | ජේ.පී. ලැයිසාමිය | වරකාපොල |
| | | | යසවතී වෙත්තසිංහ | මහරගම |
| | | | කේ.බී.ඇසලින්නෝනාමිය | මහරගම |
| | | | ඒ. සිමියොන්මයා | මීගමුව |
| | | | ඒ. අමරසිරි ද සිල්වාමයා | මීගමුව |
| | | | එම්. එම්. අබේරත්න මයා | තඹුත්තේගම |
| | | | පී. ආර්. සාදිනෝනා මිය | වරකාපොල |
| | | | අයි. පී. සොයිදා මයා | වරකාපොල |
| | | | එම්. පී. පොඩිනෝනා මිය | වරකාපොල |
| | | | ඩබ්. එච්. ලිලියා මිය | වරකාපොල |
| | | | ජේ. පී. ලැයිසා මිය | වරකාපොල |
| | | | ඒ. සිමියොන් මයා | මීගමුව |
| | | | ඒ. අමරසිරි ද සිල්වා මයා | මීගමුව |
| | | | ජේ. එම්. ඇඩ්මන් මයා | මීගමුව |
| 11 | එන්. ඒ. ප්‍රනාන්දු මහත්මිය | 06 | එම්. පීටර් පෙරේරා මයා | මහරගම |
| | | | ආර්. ඒ. කුසුමාවතී මිය | මහරගම |
| | | | ඒ. හේමපාල වික්ටර් මයා | මහරගම |
| | | | ඩබ්. ඩී. ධර්මදාස මයා | මහරගම |
| | | | ඒ. වික්ටර් මයා | මහරගම |

| | | | | |
|---|---|---|---|---|
| | | | කේ. බී. ඇසිලින් නෝනා මිය | මහරගම |
| 12 | ඩී. තම්තේගම මයා | 04 | එම්. ඩී. ලීලාවතී මිය | මහ කුඹුක්කඩවල |
| | | | ආර්. ඩී. පිනී මිය | ගිරිබාව |
| | | | එච්. එම්. හාමිනෝනා මිය | ගිරිබාව |
| | | | ආර්. එම්. ඥානලතා මිය | පොලගහවෙල |
| 13 | ආර්. එම්. කුසුමා කුමාරි මහත්මිය | 01 | ඒ. සුමනාවතී මිය | මිහින්තලේ |
| 14 | ඩබ්. එම්. වත්සලා මහත්මිය | 01 | පී. අස්පත්තියේගෙදර මිය | වත්තේගම |
| 15 | ඒ. එම්. ආර්. ඒ. ජයසුන්දර මහත්මිය | 01 | ආර්. ඇගිනෝනා මිය | කඩුවෙල |
| 16 | නන්දා කරුණාසේන මහත්මිය | 01 | එල්. ඒ. හීන්හාමි | කැළණිය |
| 17 | සුනිලා පෙරේරා මහත්මිය | 01 | අයි. දෝන ඇග්නස් මිය | කැළණිය |
| 18 | තරංගා කරුණාසේන මහත්මිය | 01 | අයි. ඇන්සිනෝනා මිය | කැළණිය |
| 19 | එම්. පී. ගුණදාස මහත්මිය සහ එම්. ඩී. අයි. යූ. ගුණදාස මෙනවිය | 2 | ඒ. සෝමා ගුණවර්ධන මිය | මිනුවන්ගොඩ |
| | | | එම්. පී. විපුලසේන මයා | මිනුවන්ගොඩ |
| 20 | කේ. පී. නිශාන්ත මයා | 01 | එම්. පී. ඇසිලින් නෝනා මිය | දොම්පේ |
| 21 | එම්. එස්. එම්. අෂ්රොෆ් මයා | 01 | අබ්දුල් රස්වාන් මයා | කළුතර |
| 22 | සීලා පියසිංහ මහත්මිය | 01 | එච්. එම්. හේරත්මැණිකේ මිය | ඉබ්බාගමුව |
| 23 | ඉන්ද්‍රානි සෙනවිරත්න මිය | 01 | යසවතී වෙත්තසිංහ මිය | මහරගම |
| 24 | දිලූපා කරුණාරත්න මහත්මිය | 01 | නෝබට් විමලරත්න මයා | පිළියන්දල |
| 25 | විනීතා මල්ලිකා මහත්මිය | 01 | පී. ඒ. සුමනා පෙරේරා මිය | තිඹිරිගස්යාය |
| 26 | ඩී. පී. වික්‍රමාරච්චි මහත්මිය | 01 | එම්. තුසිත රත්න සිල්වා මයා | බලපිටිය |
| 27 | හවීන්ද්‍ර කල්දේරා මහතා | 02 | එච්. බී. පින්සොහාමි මිය | මාලිම්බඩ |
| | | | ඩබ්. පී. ගුණවතී මෙනවිය | කුණ්ඩසාලේ |

## කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු-2014

| මාසය | කාමර වෙන් කළ ප්‍රමාණය | ආදායම රු. | වියදම් | | | |
|---|---|---|---|---|---|---|
| | | | ජල බිල්පත් රු. | විදුලි බිල්පත් රු. | පවිත්‍ර රු. | වෙනත් |
| ජනවාරි | 11 | 10,000.00 | 10,964.80 | 2,896.88 | 16,500.00 | - |
| පෙබරවාරි | 8 | 6,200.00 | 7,252.88 | 1,678.13 | 16500.00 | - |
| මාර්තු | 16 | 13,900.00 | 3,920.00 | 1,263.75 | 18,096.77 | |
| අප්‍රේල් | 29 | 21,500.00 | 7,924.00 | 3,311.25 | 10,000.00 | |
| මැයි | 26 | 24,500.00 | 7,840.00 | 4,237.50 | 9,790.00 | |
| ජූනි | 26 | 22,200.00 | 11,720.80 | 3,018.75 | | |
| ජූලි | 25 | 18,600.00 | 6,496.00 | 2,043.70 | 9,170.00 | |
| අගෝස්තු | 64 | 56,400.00 | 10,628.80 | 4,188.75 | | |
| සැප්තැම්බර් | 43 | 24,900.00 | 11,048.80 | 4,798.13 | 9,865.00 | |
| ඔක්තෝබර් | 24 | 16,500.00 | 7,840.00 | 2,701.88 | | |
| නොවැම්බර් | 39 | 29,000.00 | 8,344.00 | 2,043.75 | | 2,167,250.17 |
| දෙසැම්බර් | 68 | 69,900.00 | 8,008.80 | 4,018.13 | | |
| ***එකතුව*** | | ***313,600.00*** | ***101,988.88*** | ***36,200.60*** | ***89,921.77*** | ***2,167,250.17*** |

# ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත් කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්මවූ තම දරුවන් ඥාතීන් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථසාදක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කර ගනු ලබන අතර, දිගු කාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් වෙත ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරයි.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රුපියල් 500/- බැගින් ප්‍රතිලාභීන් 89 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබා දෙන ලදී.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්ය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්මවූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුනු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපීම් අවශ්‍යතා ආදී සියළු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද **(Adoped Child)** නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24**(I)** වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියා පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටළු විසදීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝගය නඩත්තු අඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2014

| | |
|---|---|
| 2013 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි | - 170 |
| | ↓ |
| ප්‍රමාණවත් විස්තර ලැබී නොමැති පැමිණිලි | - 25 |
| ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි | - 12 |
| ඒ අනුව අවසානය තෙක් විභාග කළ පැමිණිලි | - 133 |

| | | |
|---|---|---|
| මණ්ඩලය විසින් සමථයට පත් කළ පැමිණිලි | - 40 | 132 |
| විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කළ හා ඉඩ ලබා දිය නොහැකි පැමිණිලි | - 35 | |
| ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි | - 09 | |
| දැනට විභාග වෙමින් පවතින පැමිණිලි | - 48 | |

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

සභාපති - ඩඩ්ලි කරුණාරත්න මයා

ලේකම් - එම්. පී. පුංචිබණ්ඩා මයා

**මණ්ඩලයේ සාමාජික**

1. හසලි රාජපක්ෂ මයා
2. ආචාර්ය ලීල් ගුණසේකර මයා
3. කේ. මර්කණ්ඩු මයා
4. ඒ. ආර්. ඒ. එම්. ලාෆීර් මයා

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

**පොදු ගිණුම් ප්‍රතිපත්ති**

(අ) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව පිළියෙළ කර ඇත.

(ඈ) රජයේ ප්‍රදානයන්

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය වෙළඳ නොවන ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලබයි.

මහාභාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රධානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කෙරේ.

**ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්.**

(අ) ක්ෂය ප්‍රතිපත්ති

I. මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

II. පහත පරිදි සරළ මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| වාහන සඳහා | - | 10% |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සඳහා | - | 15% |
| යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා | - | 20% |

(ආ) ප්‍රාග්ධන හා පුනරාවර්ථන මුදල් ලැබීම් මූල්‍ය වාර්තාව තුළ ඇතුළත් කොට ඇත.

(ඈ) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම්වලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී.

ඇමුණුම - 1 ඒ

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| 2013 | විස්තරය | සටහන | පිරිවැය 2014 (රු.) | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදනය 2014 (රු.) | 2014 (රු.) ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|
| | **ස්ථාවර වත්කම්** | | | | |
| 5,631,360.63 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 17,434,652.48 | 9,082,874.58 | 8,351,777.90 |
| 12,490,000.00 | වාහන | | 16,550,000.00 | 6,150,000.00 | 10,400,000.00 |
| 1,583,615.52 | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | | 4,660,385.40 | 3,252,328.44 | 1,408,056.96 |
| | | | 38,645,037.88 | 18,485,203.02 | 20,159,834.86 |
| 19,704,976.15 | | | | | 6,488,334.23 |
| 5,871,795.65 | ආයෝජන - ස්ථාවර තැන්පත් | | | | |
| | **ජංගම වත්කම්** | | | | |
| 610,411.26 | පරිලේඛන/බඩු තොග | 14 | 630,815.49 | | |
| - | නොපියවූ අත්තිකාරම් | | - | | |
| 60,000.00 | නොපියවූ උත්සව අත්තිකාරම් | 15 | 41,000.00 | | |
| 3,521,896.00 | ආපදා ණය | 16 | 3,595,190.00 | | |
| - | ලැබිය යුතු බැංකු ගාස්තු | | 50,000.00 | | |
| 697,839.40 | මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 8 | 3,021,250.04 | 7,338,255.53 | |
| 30,466,918.46 | **මුළු ජංගම වත්කම්** | | | | |
| | **වගකීම්** | | | | |
| | **ජංගම වගකීම්** | | | | |
| 100,000.00 | විගණන ගාස්තු වෙන්කිරීම් | | 80,000.00 | | |
| 7,381,809.00 | පාරිතෝෂිත වෙන්කිරීම | 17 | 9,447,291.00 | | |
| 276,922.77 | කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල | 10 | 425,527.40 | | |
| 4,319,359.33 | පොදු තැන්පත් | 11 | 3,718,492.81 | | |
| 7,666,529.16 | උපචිත වියදම් | 9 | 60,721.80 | | |
| 520.00 | ආපසු ලබා දිය යුතු සේවක ණය | | - | | |
| 19,745,140.26 | **ශුද්ධ ජංගම වත්කම්** | | | 13,732,033.01 | (6,393,777.48) |
| 10,721,778.20 | **මුළු වත්කම්** | | | | 20,254,391.61 |
| | ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | | |
| 40,320.88 | සංචිත අරමුදල | | | (8,697,444.83) | |
| (1,000.00) | එකතු කළා : පෙර වර්ෂයේ ගැලපුම් | | | 216,942.25 | (8.480.502.58) |
| (8,737,765.71) | එකතු/අඩු ශුද්ධ අතිරික්තය | | | (602,642.36) | |
| 9,200,000.00 | රජයේ ප්‍රදානයන් - (මූලධන) | | | 9,200,000.00 | 8,597,357.76 |
| | | | | | 116,855.06 |
| | **සංචිත** | | | | |
| 652,421.75 | ස්ථාවර තැන්පත් පොලී | | | | |
| - | භාණ්ඩාගාරයේ ප්‍රදානයන් -(ප්‍රාග්ධන 2014) | | | | 10,570,735.27 |
| 9,100,000.00 | භාණ්ඩාගාරයේ ප්‍රදානයන්- (වාහන) | | | | 9,100,000.00 |
| 104,613.52 | ලෝක සෞඛ්‍ය සංවිධානයේ පරිත්‍යාග | | | | 104,613.52 |
| 363,187.76 | වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | | | | 362,187.76 |
| 10,721,778.20 | **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** | | | | 20,254,391.61 |

අත්සන් කළේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුචින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 බී

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් වාර්තාව

| 2013 | විස්තරය | සටහන | 2014 (රු.) | 2014 (රු.) |
|---|---|---|---|---|
| | **<u>මෙහෙයුම් ආදායම්</u>** | | | |
| 70,830,000.00 | රාජ්‍ය ප්‍රදාන | | 89,983,264.73 | |
| - | අමාත්‍යාංශ ප්‍රදාන | | - | |
| - | ලෝක සෞඛ්‍ය සංවිධානය | | - | 89,983,264.73 |
| | **<u>වෙනත් ආදායම්</u>** | | | |
| - | ස්ථාවර තැන්පතු පොලිය | | 616,538.58 | |
| 402,005.69 | විවිධ ආදායම් | | 389,023.62 | 1,005,562.20 |
| 71,232,005.69 | | | | 90,988,826.93 |
| | **<u>මෙහෙයුම් වියදම්</u>** | | | |
| 38,909,046.78 | පුද්ගල පඩි නඩි | 1 | 41,428,976.26 | |
| 628,279.99 | ගමන් වියදම් | 2 | 1,224,052.42 | |
| 735,667.97 | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 3 | 1,981,566.14 | |
| 533,226.30 | නඩත්තු වියදම් | 4 | 599,128.79 | |
| 5,053,370.96 | ගිවිසුම්ගත සේවා | 5 | 5,929,680.78 | |
| 30,458,670.69 | වෙනත් මෙහෙයුම් වියදම් | 6 | 35,937,720.32 | |
| 3,651,508.71 | ක්ෂය ප්‍රමාණය | 7 | 4,490,344.58 | |
| 79,969,771.40 | **මුළු මෙහෙයුම් වියදම්** | | | 91,591,469.29 |
| (8,737,765.71) | **අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය** | | | (602,642.36) |

අත්සන් කළේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුචින්ද්‍ර එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 සී

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | 2014 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ අරමුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාවලි අතිරික්තය/ඌණතාවය | (602,642.36) | |
| **මූල්‍යමය නොවන කාර්යයන්** | | |
| ක්ෂය වීම් | 4,490,344.58 | |
| **ජංගම වත්කම්** | | |
| වර්ෂ අවසාන තොග වැඩිවීම | (20,404.23) | |
| **ජංගම වගකීම්** | 2,065,482.00 | |
| පාරිතෝෂික | (73,294.00) | |
| සේවක ණය ඉතිරියේ වැඩිවීම | - | |
| නොපියවූ ආපදා අත්තිකාරම් අඩුවීම | (19,000.00) | |
| නොපියවූ උත්සව අත්තිකාරම් අඩුවීම | (616,538.58) | |
| ස්ථාවර වත්කම් පොලී වැඩිවීම | (50,000.00) | |
| ලැබිය යුතු බැංකු ගාස්තු | 20,000.00 | |
| විගණන ගාස්තු වෙන්කිරීම් වැඩිවීම | 148,604.63 | |
| සේවක ණය අරමුදල වැඩිවීම | (600,866.52) | |
| පොදු තැන්පත්වල වැඩිවීම | (7,605,807.36) | |
| උපචිත වියදම්වල අඩුවීම | - | |
| ආපසු ලබාදිය යුතු සේවක ණය වැඩිවීම | (2000.00) | |
| පසුගිය වසරේ ගැලපුම් කිරීම් | | |
| **මෙහෙයුම් කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (2,866,121.84) |
| **ආයෝජන කටයුතු තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් ශුද්ධ පොලී | - | |
| දේපල, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම්වල මිළදී ගැනීම් | (5,380,203.29) | (5,380,203.29) |
| **මූල්‍ය ක්‍රියාවලිවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන - (මූලධන) | 10,570,735.27 | |
| භාණ්ඩාගාරයේ ප්‍රදාන - (වාහන) | - | |
| ලෝක සෞඛ්‍ය සංවිධාන අරමුදල | - | |
| වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය | (1000.00) | |
| | 10,569,735.27 | 10,569,735.27 |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ අතිරික්තය/ඌණතාවය** | | 2,323,410.14 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | 697,839.40 | 697,839.40 |
| කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන් | | 3,021,250.00 |

අත්සන් කළේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන් කළේ,
සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# උප ලේඛන

| 2013 රු. | සටහන් 01 | | පුද්ගලික පඩි නඩි | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 21,609,505.29 | | (I) | වැටුප් හා වේතන | 21,682,066.40 |
| 3,451,767.26 | | (II) | සේවක අර්ථසාධක අරමුදල | 3,604,843.37 |
| 862,941.56 | | (III) | සේවක භාරකාර අරමුදල | 901,210.65 |
| 526,636.77 | | (IV) | අතිකාල | 328,285.92 |
| 42,173.25 | | (V) | නිවාඩු දින වැටුප් | 72,644.15 |
| 8,428,803.22 | | (VI) | ජිවන වියදම් දීමනා | 9,804,423.86 |
| 3,987,219.43 | | (VII) | ජීවන වියදම් දීමනා | 5,035,501.91 |
| 38,909,046.78 | | | **එකතුව** | 41,428,976.26 |

| 2013 රු. | සටහන් 02 | | ගමන් වියදම් | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 628,279.99 | | (I) | දේශීය | 1,164,217.50 |
| - | | (II) | විදේශීය | 59,834.92 |
| 628,279.99 | | | **එකතුව** | 1,224,052.42 |

| 2013 රු. | සටහන් 03 | | සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 310,941.12 | | (I) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,466,631.84 |
| 404,726.85 | | (II) | ඉන්ධන හා ලිහිසි තෙල් | 502,934.30 |
| 20,000.00 | | (III) | නිල ඇඳුම් | 12,000.00 |
| 735,667.97 | | | **එකතුව** | 1,981,566.14 |

| 2013 රු. | සටහන් 04 | | නඩත්තු වියදම් | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 455,161.80 | | (I) | වාහන | 396,155.14 |
| 78,064.50 | | (II) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 202,973.65 |
| 533,226.30 | | | **එකතුව** | 599,128.79 |

| 2013 රු. | සටහන් 05 | | ගිවිසුම් සේවා | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 85,000.00 | | (I) | ප්‍රවාහන | 166,032.00 |
| 354,161.51 | | (II) | තැපැල් හා විදුලි සංදේශ සේවා | 450,892.74 |
| 696,760.81 | | (III) | විදුලිය සහ ඉන්ධන | 866,049.85 |
| 53,463.92 | | (IV) | පිරිසිදු කිරීමේ ගාස්තු | 246,756.00 |
| 30,263.00 | | (V) | පුවත්පත් | 25,990.00 |
| 25,116.50 | | (VI) | සංග්‍රහ වියදම් | 33,269.15 |
| 50,000.00 | | (VII) | විගණන ගාස්තු | 51,904.00 |
| 733,457.36 | | (VIII) | ජාතික සභාව සඳහා දීමනා | 451,550.00 |
| 700,597.00 | | (IX) | නඩත්තු මණ්ඩලය සඳහා දීමනා | 987,929.00 |
| 786,802.36 | | (X) | අනෙකුත් දීමනා | 582,326.04 |
| 10,050.00 | | (XI) | බැංකු ගාස්තු | 1,500.00 |
| 1,527,698.50 | | (XII) | පාරිතෝෂිකය | 2,065,482.00 |
| 5,053,370.96 | | | එකතුව | 5,929,680.78 |

| 2013 රු. | සටහන් 06 | | වෙනත් මෙහෙයුම් වියදම් | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 6,425,811.00 | | (I) | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | 3,784,490.00 |
| 411,690.00 | | (II) | හැඳුනුම්පත් නිකුත් කිරීම | 458,937.75 |
| 336,995.00 | | (III) | දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබා දීම | 1,870,962.06 |
| 154,000.00 | | (IV) | ප්‍රකාශන | 1,775,344.88 |
| 3,108,601.37 | | (V) | පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 3,984,751.00 |
| 5,098,500.00 | | (VI) | වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම | 7,716,450.00 |
| 5,837,470.80 | | (VII) | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | 6,603,329.28 |
| 1,299,056.09 | | (VIII) | වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම | 1,248,180.61 |
| 2,516,791.33 | | (IX) | වෙනත් වියදම් | 301,837.10 |
| 4,743,161.10 | | (X) | වැඩිහිටි නිවාස අළුත්වැඩියාව සහ නඩත්තුව | 5,206,965.44 |
| 526,594.00 | | (XI) | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2,986,472.20 |
| 30,458,670.69 | | | එකතුව | 35,937,720.32 |

| 2013 රු. | සටහන් 07 | | ක්ෂය ප්‍රමාණය | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 1,474,953.03 | | (I) | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,968,476.02 |
| 1,655,000.00 | | (II) | වාහන | 1,655,000.00 |
| 521,555.68 | | (III) | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | 866,868.56 |
| 3,651,508.71 | | | එකතුව | 4,490,344.58 |

| 2013 රු. | සටහන් 08 | | බැංකු ගිණුම් | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 63,428.96 | | (I) | බැංකු ශේෂය - ගි/අ - 228075 | 2,312,528.97 |
| 204,426.09 | | (II) | බැංකු ශේෂය - ගි/අ - 5234881 | 428,984.35 |
| 429,984.35 | | (III) | බැංකු ශේෂය - ගි/අ - 9179076 | 279,736.72 |
| 697,839.40 | | | එකතුව | 3,021,250.04 |

| 2013 රු. | සටහන් 09 | | උපචිත වියදම් | 12/31/2014 රු. |
|---|---|---|---|---|
| 97,403.00 | | (I) | ගෙවිය යුතු ගමන් වියදම් | |
| 52,675.00 | | (II) | ගෙවිය යුතු හැදුනුම්පත් දීමනා | |
| 154,000.00 | | (III) | ගෙවිය යුතු මුද්‍රණ වියදම් | |
| 49,075.14 | | (IV) | ගෙවිය යුතු අතිකාල | |
| - | | (V) | ගෙවිය යුතු ජාතික සභා දීමනා | |
| 9,230.94 | | (VI) | ගෙවිය යුතු තැපැල් හා දුරකතන ගාස්තු | |
| - | | (VII) | ගෙවිය යුතු ආරක්ෂක ගාස්තු | |
| - | | (VIII) | ගෙවිය යුතු පිරිසිදු කිරීමේ ගාස්තු | |
| 2,140.00 | | (IX) | ගෙවිය යුතු පුවත්පත් වියදම් | |
| 792,000.00 | | (X) | ගෙවිය යුතු අක්ෂි කාච හා සෞඛ්‍ය සායන වියදම් | |
| - | | (XI) | ගෙවිය යුතු විදුලි හා ජල බිල්පත් | |
| 99,000.00 | | (XII) | ගෙවිය යුතු දිවා මධ්‍යස්ථාන ආධාර | |
| 102,588.81 | | (XIII) | ගෙවිය යුතු වැඩිහිටි නිවාස ආධාර | |
| 301,777.04 | | (XIV) | ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම් | |
| 386,361.83 | | (XV) | ගොඩනැගිලි වෙන්කිරීම් | 60,721.80 |
| 1,707,450.00 | | (XVI) | ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම | |
| 93,664.00 | | (XVII) | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම | |
| 750.00 | | (XVIII) | බැංකු ගාස්තු | |
| 2,290,647.00 | | (XIX) | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | |
| 1,527,766.40 | | (XX) | යන්ත්‍රෝපරණ හා සවිකිරීම් | |
| 7,666,529.16 | | | එකතුව | 60,721.80 |

# විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2015 ජුලි 29 දින නිකුත් කරනලදී.

# තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්/බි/එන්සීර්/1/14/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 දෙසැම්බර් 08 දින.

සභාපති,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2015 ජූලි 29 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව වෙත ලැබෙන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගී කර ගනිමින් වත්කම් අත්පත් කර එම වත්කම් ක්ෂය කර තිබුණද වත්කම් සම්බන්ධව ක්‍රමක්ෂය ගිණුම් ගත කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල දරන ලද රු.10,320,031 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම පුනරාවර්තන වියදම් ලෙසත් පුනරාවර්තන වියදම් රු.2,767,541 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සභාව විසින් ගිණුම් පිළියෙල කිරීමේදී උපචිත පදනමට ගිණුම් පිළියෙල කර ඇති නමුත් සමාලෝචිත වර්ෂයට අදාල රු.2,485,284 ක ගෙවිය යුතු වියදම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන සහ ප්‍රාග්ධන කාර්යයන් සඳහා වියදම් දැරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යවා ඇති මුදල් වියදම් ලෙස ගිණුම් කර ඇතත්, වියදම් දැරීමකින් තොරව ආපසු එවන ලද රු.465,192 ක් අදාල වියදම් ගිණුම්වලට ගැලපීමකින් තොරව ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | <u>නීති රීති රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u>. |
|---|---|---|
| (අ) | 1971අංක 38 දරන මුදල් පනතේ 8 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 214 | බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නිති පතා පරීක්ෂා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 751 හා 763 | ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ලැබීම් පැත්තේ ඇතුළත් කලයුතු වුවත් එකතුව රු. 297,173 ක් වූ භාණ්ඩ 03ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 845 -(1) | සියළුම රාජකාරී දුරකථන සඳහා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 571 | එකතුව රු.1,370,041 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>---------------------- | |
| | (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| | (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | පරිගණක හා උපාංග මිලදී ගැනීමේදී අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කර නොගෙන ගෙවීම් නොකල යුතු වුවද පරිගණක 30 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.1.1 ඡේදය | තරඟකාරී මිල කැඳවීමකින් තොරව එකතුව රු.3,217,680 ක් වටිනා පරිගණක 30 ක් මිලදී ගෙන තිබුණි. |

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 602,642 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,737,766 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,135,124 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. රජයේ ප්‍රදාන රු.19,153,264 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි.

රියදුරකු ලෙස පත් කර තිබූ පුද්ගලයෙකුගේ සේවය අවසන් කිරීමට එරෙහිව කම්කරු විනිශ්ච සභාවේ හා මානව හිමිකම් කොමිසමේ පෙත්සමක් ගොනුකර තිබුණ අතර ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වැඩිහිටි කමිටු පිහිටුවීමට අදාල භෞතික ප්‍රගතිය සැලසුම්ගත ප්‍රමාණ සමඟ සැසඳීමේදී ගම් මට්ටමේ සියයට 101 ක්ද , ප්‍රාදේශීය මට්ටමේ සියයට 26 ක්ද , දිස්ත්‍රික් මට්ටමේ සියයට 13 ක්ද හා පළාත් මට්ටමේ සියයට 20 ක් වී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ වැඩිහිටි හැඳුනුම්පත් 40,000ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තා අනුව 10,978 ක් පමණක් නිකුත් කර තිබුණ අතර ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 27 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 48 ක් විය.

(ඇ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොකළ කාර්යයන් 5 ක් වෙනුවෙන් රු.1,595,605 ක් වැයකර තිබුණි.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඈ) වැඩිහිටි දීමනාව ගෙවීමට අදාලව දිවයින පුරා සිටින වැඩිහිටි දීමනා ලාභීන් සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය, ගෙවූ ප්‍රතිලාභී සංඛ්‍යාව හා නොගෙවූ මුදල් ප්‍රමාණය පිළිබඳ හා ප්‍රතිලාභීන් මියයාම පිළිබඳ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 59 ක් පවත්වා නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ පුහුණු වැඩසටහන් 310 ක් පවත්වා තිබුණි.

(ඊ) 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාර සභාව විසින් ඉටුකළ යුතු ප්‍රධාන කර්තව්‍යන් දහයක් ඉටුකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2003 අගෝස්තු 22 දින සමාජ සේවා අධ්‍යක්ෂක විසින් කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයට අයත් සියලු නිශ්චල හා චංචල දේපල සභාවට පවරා දී තිබුණි. එදින සිට සමාලෝචිත වර්ෂය දක්වා අවුරුදු 11 ක කාලයක් ගතවී තිබුණද එම ඉඩම හා ගොඩනැගිල්ල නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

වැඩිහිටි සුභසාධන කටයුතු සඳහා යෙදවිය යුතු රු.6,488,334 ක් අදාල අරමුණු සඳහා යොදා නොගෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

## 4.4 වෙනත් රාජ්‍යආයතන වෙත ලබාදුන් සභාවේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව ආයතනය සතු මෝටර් රථයක් සමාජ සේවා අමාත්‍යංශයට නිදහස් කර තිබුණි

## 4.5 කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසානයට මාණ්ඩලික නිලධාරීන් 3 දෙනෙකු හා මාණ්ඩලික නොවන නිලධාරීන් 6 දෙනෙකුගේ පුරප්පාඩු පැවැති අතර, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක් සභාවේ කටයුතු වල යොදවා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් ගිණුම් ඉදිරිපත් කර තිබුණේ මාස 03 ක් ප්‍රමාද වී එනම් 2015 මැයි 29 දිනය.

### 5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සැලැස්මේ ඇතුළත් නොවූ Nokia D 7000 කැමරාවක් හා රූපවාහිනී යන්ත්‍රයක් රු.138,000 ක් වැයකර මිලදීගෙන තිබුණි.

### 5.3 විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම්.

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.4 අයවැය පාලනය.

අයවැය ලේඛනයේ ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 83 ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ලේඛන පවත්වාගෙන යාම
(ඇ) තොග පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சு
Ministry of Social Services, Welfare & Livestock Development

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
National Secretariat for Elders

(210)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: NSE/FC3/GENERAL/QUIRES | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date: 2015.08. 25 |

ලේකම්,
සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින්,

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමු කරන ලද අංක එල්එස්/බී/එන්සීඊ/1/14/06 හා 2015.07.29 දිනැති විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි නිරීක්ෂණ කාරුණිකව ඉදිරිපත් කරමි.

02. *මූල්‍ය ප්‍රකාශන*

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.1.1 *ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම*

(අ) නව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2014 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශය සකස් කිරිමට අවශ්‍ය කටයුතු කල නමුත්, ප්‍රමිත අංක 01 හි 21 ඡේදයේ (ඉ) පරිදි සත්‍ය වියදම් සමග 2015 වර්ෂයේ දී මෙම වාර්තාව සඳහා අයවැය ගත වියදම් ඇතුළත් කර අවසන් මූල්‍ය මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කිරිමට කටයුතු කරමි.

(ආ) ප්‍රමිත අංක 01 හි 21 ඡේදයේ (ඇ) අනුව ශුද්ධ වත්කම්/ ස්කන්ධයේ වෙනස් විම් වාර්තාවක් 2013 වර්ෂය වනතෙක්ම අවසාන ගිණුම් සමග ඉදිරිපත් කර නොමැති අතර එයට අදාල දත්ත නිවැරදි ලෙස සකසා ගැනිමට නොහැකි විම නිසා 2014 වර්ෂයේද මෙම වාර්තාව සකස් කිරිමට නොහැකි විය. නමුත් මේ වන විට 2015 වර්ෂයේ දි මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්, 2015 අවසාන ගිණුම් වාර්තා සමග මෙම වාර්තාව ඉදිරිපත් කරන බවත් දන්වා සිටිමි.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி ,தொகுதி D, செத்சிறிபாய - கட்டம் II, பத்திரமுல்லை
Address : 2nd Floor , Block D, Sethsiripaya - II Stage, Baththaramulla.
ඊ-මේල් / ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2187045
කාර්යාලය / அலுவலகம் / Office : 3094543
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015

(ඈ) 2014 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් සඳහා රු.මිලියන 90 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 20 ක් ද අනුමත විය. ඒ අනුව අයවැය ගත මුදල ඉක්මවා වැය කිරීම් සිදුකර නොමැත.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්වය ප්‍රකාශණය විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව 2015 වර්ෂයේ සිට අඩුපාඩු සකස් කර නිවැරදි ආකෘතිය යටතේ අවසන් මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

2.2.2 *ගිණුම්කරණ අඩුපාඩු*

(අ) කතරගම වැඩිහිටි නිවාසයේ හා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයේ භූමිය තක්සේරු කිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරු වෙත ලිඛිතව දන්වා යවා ඇත. (ඇමුණුම 01) ඒ අනුව ඉදිරියේදී නිශ්චල හා චංචල දේපල තක්සේරු කර අවසන් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

2004 වර්ෂයේ සිටම අලුත් වැඩියා හා ඉදිකිරීම් සඳහා වන මුදල පුනරාවර්ථන වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සඳහන් කර ඇති අතර එම නිසා 2014 වර්ෂයේ මෙම වියදම පුනරාවර්ථන වියදමක් ලෙස දක්වා ඇත. නමුත් 2015 වර්ෂයේ දි මෙම වත්කම තක්සේරු කර ගිණුම් කටයුතු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කරුණිකව දන්වා සිටිමි.

(ආ) ප්‍රමාද වී කාර්යාලයට ලැබීම නිසා අතපසු වීමකින් 2014 වර්ෂයට අදාල උපචිත වියදම් රු. 2,485,284 ක් ගිණුම් ගත කිරීමට නොහැකි වීමෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය අඩුවෙන් සඳහන් වී ඇත. මෙය 2015 වර්ෂයේ දි පෙර වර්ෂ ලාභ ගැලපුම් ගිණුම මගින් සකස් කිරීමට කටයුතු කරන අතර මෙවැනි අතපසු වීම් නැවත සිදු නොකරන ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් දෙන ලදි.

(ඇ) පෙර වසර වලදි මෙන්ම විවිධ වැඩසටහන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වියදම් දැරීමට යවා ඇති මුදල් වල ඉතිරි මුදල් ආපසු ලැබීමේදි එය සටහන් කර ගනු ලැබුයේ අදාල වර්ෂයේ ආදායමක් ලෙස වේ. නමුත් විගණනයෙන් මෙම සටහන් තැබීම වැරදි ලෙස පෙන්වා දිමෙන් අනතුරුව එම වරද නිවැරදි කර ගැනිමටත් ඒ අනුව ගිණුම් ඉදිරිපත් කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.

(ඈ) ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුමෙහි සහ විවිධ තැන්පතු ගිණුමට අතපසු වීමකින් කතරගම හා යාපනය වැඩිහිටි නිවාස ඉදිකිරීමේදි රඳවාගත් මුදල් සටහන් කර නොමැති අතර මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඉ) සියළුම ජර්නල් සටහන් ලෙජරයේ පිටපත් කිරීමට පෙර නිසි නිලධාරීන්ට අදාල අත්සන තබන ලෙස උපදෙස් ලබා දෙන අතර ඉදිරි වර්ෂයේදී මෙය නිවැරදි ලෙස ඉදිරිපත් කරමි.

(ඊ) කතරගම වැඩිහිටි නිවාසයේ පැති තාප්පය ඉදිකිරීම සඳහා ලබාදුන් මුදලේ ඉතිරිය වූ රු. 10,385 ක් මුදල කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නැවත එවා තිබු අතර,මෙය

පසුගිය වසරේ වියදමක් වු බැවින් මෙම වර්ෂයේ වියදමෙන් අඩු කිරීම් නොකර විවිධ ආදායම් බැර කළ යුතු බව විගනනයෙන් පෙන්වා දී ඇති බැවින් ඉදිරියේදි අදාල වැය ගිණුම් වලට බැර කිරිමට කටයුතු කරන බව දන්වා සිටිමි.

(උ) රියදුරෙකුගේ සේවය අවසන් කිරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර මින් ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල මෙවැනි තොරතුරු ඇතුළත් කිරීම සඳහා විෂය නිලධාරීන් දැනුවත් කර ඇත.

(ඌ) මෙම කැමරා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්, සමාජ සේවා නිලධාරින්, පළාත් සමාජ සේවා නිලධාරින්, දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරින්, සමාජ සංවර්ධන නිලධාරින් හට කාර්යාල කටයුතු සඳහා භාවිතයට (හැඳුනුම්පත් ජායාරූප ලබා ගැනිමට වැනි) යොදා ගන්නා නිසා කාර්යාල යන්ත්‍ර උපකරණ ලෙස අර්ථකථනය කර ඒ යටතේ ගිණුම්ගත කර ඇත.

(එ) මෙම මුදල යොදා සිදු කිරීමට නියමිතව තිබූ කාර්යය පිළිබඳව වර්තමාන තත්ත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් කැඳවා ඇත. පිළිතුරු ලද පසු ඉදිරියට කටයුතු කරමි.

(ඒ) ලෙජරයේ විවිධ තැන්පත් සඳහා ගිණුම් පවත්වාගෙන යාමට උපදෙස් ලබා දෙන ලදී.

2.5.3 <u>නොසැසඳුනු පාලන ගිණුම්</u>

(අ) 2014 වර්ෂයට අදාල ලී බඩු හා කාර්යාල උපකරණ මිල දී ගැනිම සඳහා වු සත්‍ය වියදම රු. 4,688,893 ක් වුවද පසුගිය වර්ෂයේ දි මිලදි ගැනිම් වලට අදාලව මෙම වර්ෂයේ දි උපචිත වියදම් ගිණුමෙන් ගෙවීම් සිදු කරන ලද මුදල අතපසු විමකින් ලේඛනයේ සටහන් කර ඇති බව දන්වා සිටිමි.

(ආ) 2014 වර්ෂයට අදාල යන්ත්‍ර හා පිරියත මිල දී ගැනිම සඳහා වු සත්‍ය වියදම රු. 619,310.00 ක් වුවද පසුගිය වර්ෂයේ මිල දි ගැනිම් වලට අදාලව මෙම වර්ෂයේ දි උපචිත වියදම් ගිණුමෙන් ගෙවීම් සිදුකරන ලද මුදල අතපසු විමකින් ලේඛනයේ සටහන් කර ඇති බව දන්වා සිටිමි.

(ඇ) 2014 වර්ෂයට අදාල ලී බඩු හා කාර්යාල උපකරණ මිල දී ගැනිම හා යන්ත්‍ර හා පිරියත මිල දී ගැනිම සඳහා වු සත්‍ය වියදම සටහන් කිරිමේ දි පසුගිය වර්ෂයේ උපචිත වියදම් සමග අතපසු විමකින් සටහන් කර ඇත.

(ඈ) 2014 වර්ෂයට අදාල තොග වටිනාකම රු. 630,815 ක් වේ. මගේ උපලේඛනයට අනුව CR Book II පොත් 36 ක් එකක් රු. 56.22 බැගින් වටිනාකම රු. 2024 ක ප්‍රමාණය ලේඛනගත කිරිමේදි ප්‍රමාද දෝශයකින් සටහන් වි නොමැත.

(ඉ) විවිධ තැන්පත් ගිණුමේ ලැබීම් සඳහා අතපසු වීමකින් ඇතුලත් නොවූ රු. 78,911 ක් ඇතුලත් කරමින් නිවැරදි කිරිම 2015 ගිණුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කිරිමට කටයුතු කිරීමට උපදෙස් දී ඇත.

2.5.4 *විගණනය සඳහා සාක්ෂි නොවීම.*

(අ) 2015 වසරේදී ස්ථාවර වත්කම් ලේඛණ යාවත්කාලීන කිරීමට සහ අදාල විස්තරාත්මක උපලේඛණ සකස් කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ආ) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් අක්ෂිකාච දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දී ඇති අතර ඒම අක්ෂිකාච භාර ගත් බවට ලිඛිත සාක්ෂි කාර්යාලය සතුව පවතී. කොළඹ දිස්ත්‍රික්කයේ කාච පමණක් ප්‍රධාන කාර්යාලය මගින් ලබා දී ඇති අතර එහි අත්සන් ලේඛණද කාර්යාලය සතුව ඇත. ශෛල්‍ය කර්මය අවසන් කල බවට වාර්තා ද මේ වන විට කාර්යාලයට ලැබී ඇත.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සනාථ කිරීම් කොටසක් ලැබී ඇති නමුත් සියළුම මුදල් ලැබීම් සනාථ වී නොමැත. මෙම ලැබීම් සනාථ කර ගැනීමට පියවර ගෙන ඇත.

(ඈ) මෙම ශේෂය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙහි පොදු තැන්පත් ගිණුමේ පවත්නා වර්ෂයේ සිට වසර 2 කට ඉහත සිට පැවතෙන්නක් වන අතර ශේෂය පිළිබඳව තහවුරු කිරීම් ලබා ගැනීමට අපහසු වී ඇත. එවකට ඉදිරිපත් කර ඇති අවසන් ගිණුම් වාර්තාවලද මේ පිළිබඳ දක්වා නැත. එබැවින් මෙම ශේෂය රජයේ ආදායමට බැර කිරීම සම්බන්ධව 2015 වර්ෂයේදී අවශ්‍ය කටයුතු සිදු කරමි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොවූ අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 100ක් වෙත පමණක් මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 100 වෙනුවෙන් මුදල් ලද බවට, හා අදාල වියදම් වාර්තා ලැබී ඇත.

(ඊ) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් වෙත මේ පිළිබඳ දැනුවත් කිරීමට සිහිකැඳවීම් ලිපි යැවීමට කටයුතු කරනු ලැබේ. මින් ඉදිරියට අදාල නිලධාරීන්ගෙන් මසකට ඡායාරූප 03 බැගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම ක්‍රමවත්ව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ) මෙම පරිගණක 12 අතරින් පරිගණක 07ක් පිළිබඳ තහවුරු කිරීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලැබී ඇති අතර ඉතිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ගෙන්වා ගැනීමට කඩිනම් පියවර ගෙන ඇත.

(ඌ) අදාල සනාථ කිරීම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති අතර තොරතුරු විමසා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් යවා ඇත.

**2.5.5** *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.*

(අ) 2014 වර්ෂයේ මුල් කාලය තුළ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සඳහා සාමාජිකයින් පත්කර නොතිබුණි. එබැවින් 2014 වර්ෂය ආරම්භයේ අයවැය ලේඛණය සභාව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව නොමැති වූ නමුත් එම වසරේ සංශෝධිත අයවැය වාර්තාව 2014.10.31 දින ජාතික සභාව රැස් වූ පසු අනුමත කර ගෙන ඇත. (ඇමුණුම 02)

(ආ) මු.රෙ. 110

මේ වන විට ආයතනයේ හානි හා පාඩු වාර්තා කිරීමට ලේඛණයක් පවත්වාගෙන යන අතර, අදාල ලේඛණ යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ii) මු.රෙ. 214

විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව බැරකම් පිළිබඳ ලේඛණයක් පවත්වාගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(iii) මු.රෙ. 751,763

රු. 297,173 ක් වටිනා භාණ්ඩ බඩු ලේඛණ පොතෙහි ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.

(iv) මු.රෙ 845 (I)

මෙමගින් පෙන්වා දී ඇති පරිදි මාසික දුරකථන ගාස්තු ගෙවීමේ ලේඛණයක් මේ වන විට යාවත්කාලීන කර පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත.

(v) මු.රෙ. 565 – (4)

විගණනයේදී මෙම කාරණා අනාවරණය වූ පසු මෙවැනි අඩුපාඩු මගහරවා තැන්පත් ගිණුම පවත්වාගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

CAD-5652 දරන මෝටර් රථය හා KH-0515 දරන මෝටර් රථය එවකට හිටපු අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම මත තාවකාලිකව අමාත්‍යාංශය වෙත ලබා දුන් අතර මේ වන විට CAD-5652 දරන කාර් රථය නැවත මෙම ආයතනය වෙත ලබා ගෙන ඇත.

(ඈ) හාණ්ඩාගාර චක්‍රලේඛ

(i) (i) 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 ප්‍රකාරව ලී බඩු උපකරණ සහ යන්ත්‍ර සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ii) වත්කම් තක්සේරු කිරීමට දන්වා යවා ඇති අතර තක්සේරු වටිනාකම් ලද විගස එම ලේඛණයට ඇතුළත් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ii) මින් ඉදිරියේදී පරිගණක මිලදී ගැනීමේදී අදාල ආකෘතිය අනුව මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු කරන ලෙස විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ඉ) මින් ඉදිරියේදී නිවැරදි මිල කැඳවීම් සහිතව ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීමට පියවර ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

2014 වර්ෂයේ උපචිත වියදම් ලෙස නොදක්වා ඇති ප්‍රමාණය හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රතිඵලයේ ඌණතාවය පෙන්නුම් කර ඇති අතර, 2015 වර්ෂයට ඉදිරිපත් කිරීමට නියමිත මූල්‍ය ප්‍රකාශය මගින් නිවැරදි කිරීම් සහිතව මෙම ගැටළුව නිරාකරණය කිරීමට පියවර ගෙන ඇත.

3. 2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) 2014 වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ වල එකතුව රු. 2,323,411.00 ක් වේ. මෙයට ප්‍රධානතම හේතුව වුයේ දෙසැම්බර් මාසයේ ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලැබීමත්, පෙර වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා විවිධ වැඩසටහන් හා මිල දී ගැනීම් සූදානම් කර තිබුණ ද ඒ සඳහා අප කාර්යාලයට ප්‍රමාණවත් අක්මුදල් නොලැබිණි. එම නිසා 2014 වර්ෂයේ අවසන් කාර්තුවේ දි වැඩසටහන් හා මිල දි ගැනීම් සඳහා අක්මුදල් නොලැබේ යැයි අපේක්ෂා කළ නමුත් අනපේක්ෂිත ලෙස දෙසැම්බර් මස 19, 20, 26 යන දිනවලදී ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් දැරීම සඳහා අක්මුදල් ලැබුණි. වැඩසටහන් සහ මිල දි ගැනීම් සම්බන්ධයෙන් පෙර සූදානමක් නොතිබීම හා ඉතා ඉක්මනින් සූදානම් කිරීමට නොහැකි වීම නිසා ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 13 ක් ද එම වසරට අදාලව වැඩසටහන් සඳහා ලබා දුන් ප්‍රතිපාදන ඉතිරි වීම් අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව නැවත ආයතනයට එවීම නිසා වර්ෂ අවසාන ශේෂය 2013 වර්ෂයට වඩා වැඩිවීමක් පෙන්නුම් කරයි.

(ආ) 2013 වර්ෂයේ සිට පැවති උපචිත වියදම් 2014 වර්ෂය තුළදී නිරවුල් වූ බැවින් ශේෂයේ අඩුවීමක් පෙන්නුම් කරයි.

(ඇ) මෙහෙයුම් කටයුතුවලදී ජංගම වත්කම් හා ජංගම වගකීම් ශේෂයන්ගේ සිදු වී තිබෙන වෙනස්වීම් හේතුවෙන් මෙසේ අනුපාතවල වෙනස්වීමක් සිදුවී ඇත.

4. *මෙහෙයුම් සමාලෝචනය*

4.1 *කාර්ය සාධනය*

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම

(i) ලිපිගොනුවල සඳහන් පරිදි ග්‍රාමීය මට්ටමේ කමිටු 1012 ක් සඳහා මුදල් ලබා දී ඇත. දත්ත වාර්තා කිරීමේදී යම්කිසි අතපසු වීමකින් සිදුවී ඇති අතර මින් ඉදිරියේදී එවැනි අතපසුවීම් සිදු නොවීමට වග බලා ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

(ii) සමාලෝචිත වර්ෂයේ සත්‍ය වියදම නිවැරදි වන අතර පසුගිය වර්ෂයේ ගෙවිය යුතු වූ වියදම් ප්‍රමාණයක් ගෙවන ලද බැවින් සමස්ථ වියදම 5,492,000 ක් විය.

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම

වැඩිහිටි හැඳුනුම්පත් ලබාදීම නව මුහුණුවරකින් ඉටු කිරීමට අපේක්ෂා කල අතර එම කටයුත්ත ඉටු කිරීම වෙනුවෙන් හැඳුනුම්පත් මුද්‍රණය කිරීම තාවකාලිකව නවත්වන ලදී. එම හේතුවෙන් වර්ෂය මුල වෙන්කල ප්‍රතිපාදනයෙහි ඉතිරියක් වර්ෂය අවසානය වන විට පෙන්නුම් කළ හෙයින් භෞතික හා මූල්‍ය ප්‍රගතියෙහි අඩුවීමක් පෙන්නුම් කරයි.

(ඇ) වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් යෙදවීම.

ප්‍රගති වාර්තාවල දක්වා ඇති රු. 1,796,000 වන මුදල දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබා දීම සඳහා වියදම් වූ අතර වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ආශ්‍රිත වෙනත් කාර්යයන් සඳහා වියදම් වූ මුදල් ද ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල රු. 1,870,962 මුදලක් දක්වා ඇත.

(ඇ) ප්‍රකාශන

ප්‍රකාශන වියදම් යටතේ අත්පත්‍රිකා හා පනත මුද්‍රණය කළ යුතු වුවත් අදාල අත් පත්‍රිකා දැයට කිරුළට සමගාමීව මුද්‍රණය කිරීමට කටයුතු කෙරිණි. එහෙයින් පනත් මුද්‍රණය කිරීමටඅවශ්‍ය නොවූ හෙයින් මුද්‍රණය නොකරන ලදී.

එසේ වුවත් වැඩිහිටියෝ සහරාව, දෙටුවර සිතුවිලි, දෙටුවර කවිසිත යන දෑ මෙම කාර්යාලීය ප්‍රකාශන හෙයින් අදාල ප්‍රකාශන සඳහා වියදම් මෙම කාර්ය වෙතින් දරා තිබුණි.

(ඉ) <u>අක්ෂිකාච මිළදී ගැනීම සහ බෙදා හැරීම.</u>

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අඩු ආදායම්ලාභී මහජනතාව වෙතින් ලැබෙන ලද ඉල්ලීම් මත අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබා දීමේ වැඩසටහන සාර්ථකව සිදු කරන ලද අතර ඒ සඳහා පැවති ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා වැඩි වියදම් දැරීමට සිදු විය.
මින් ඉදිරියට එවැනි කටයුතු සිදු නොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

(ඊ) <u>නඩත්තු මණ්ඩල රැස්වීම්</u>

පළාත් මට්ටමින් වැඩිහිටි නඩත්තු මණ්ඩල පිහිටුවීමේ අරමුණ ඇතිව රු. 1,700,000 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. නමුත් එවකට පැවති ජාතික සභාව මගින් පළාත් මට්ටමින් නඩත්තු මණ්ඩල පිහිටුවීම පිළිබඳ ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන තෙක් තාවකාලිකව පළාත් මට්ටමින් නඩත්තු මණ්ඩල පිහිටුවීම සිදු නොවිණි. එම නිසා ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇති නඩත්තු මණ්ඩලය සඳහා පමණක් එම වර්ෂයේ මදල් වියදම් කිරීම සිදු විය.

(උ) <u>වැඩිහිටි දීමනා ගෙවීම</u>

(i) අදාල ප්‍රතිපාදන හා අක්මුදල් භාණ්ඩාගාරය විසින් සමාජ සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙත ඇතුළත් කරමින් ඉදිරිපත් කර ඇති හෙයින් එම ගෙවීම් කටයුතු අමාත්‍යාංශයෙන් සිදු කළ අතර එම කටයුතුවල පසුවිපරම් ක්‍රියාවලිය පමණක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් සිදු කර ඇත.

(ii) දීප ව්‍යාප්තව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ඒකාබද්ධ වන ලෙස පරිගණක ජාල පද්ධතියක් දියත් කිරීම සුවිශාල මුදලක් වැයවන සංකීර්ණ කාර්යක් වුවත් සිදු කිරීමේ අවශ්‍යතාවය පිළිගනිමි. මෙම කටයුත්ත තනිව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට සිදු කළ නොහැක්කක් බව හඳුනාගත් අතර 2015 වන විට මෙහි වැදගත්කම සලකා අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පරිගණක ජාලයක් ක්‍රියාත්මක කරවීමට මූලික පියවර ගෙන ඇත. මේ අනුව ඉදිරියේදී මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන්නෙමු.

(iii) මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු පරිගණක ගත කොට ලබා ගැනීමට ආකෘති කීපයක් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනට හඳුන්වා දී ඇති අතර එමගින් තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීමේ හැකියාව වර්තමානයේ උදා කරගෙන ඇත.

(ඌ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව,

උපදේශන වැඩසටහන් - 25

ප්‍රාදේශීය වැඩිහිටි සත්කාරක සේවා - 09

විශ්‍රාම පූර්ව වැඩසටහන් - 25 ක් වශයෙන් වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ අතර ප්‍රගති වාර්තාව සකස් කිරීමේ අදාල නිලධාරීන් විසින් උක්ත වැඩසටහන් වෙනුවට ප්‍රාදේශීය දැනුවත් කිරීම්, දිස්ත්‍රික් පුහුණු වැඩසටහන්, පළාත් පුහුණු වැඩසටහන් ආදී වශයෙන් තොරතුරු ලබා දී ඇති හෙයින් ඒ අනුව ප්‍රගති වාර්ථා සකස් කර ඇත.

(ii) පුහුණු වැඩසටහන් තුළ එක් එක් වැඩසටහන් කොපමණද යන්න හඳුන්වා දීම සිදු කර නොමැති බව පිළිගනිමි. ඉදිරියේදී අදාළ වැඩසටහන් හඳුන්වාදීමට පියවර ගනිමි.

(එ) පනතේ කර්තව්‍යන් ක්‍රියාත්මක නොකෙරුණු අවස්ථා

(i), (ii) සහ (iii)

කාර්යමණ්ඩල ඌණතාවය හේතුවෙන් පනතේ ඇතැම් වගන්ති මත ක්‍රියාත්මක වීමේ ඌනතා පැවති අතර නව බඳවා ගැනීම් මේ වන විට සිදු කර ඇති හෙයින් ඉදිරියේදී මෙවැනි ගැටළුවලින් මිදීමට හැකිවනු ඇත.

(iv) අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලට වැඩි නැඹුරුවක් ලබාදීමේ අදහසින් කාර්ය මණ්ඩලය ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාවන්ට යොමු කර ඇත. ඉදිරියේදි මෙහි වැදගත්කම නව මුහුණුවරකින් හඳුන්වා දෙමින් මෙම පුහුණු සඳහා සහභාගීත්වය වැඩි කිරීමට පියවර ගෙන ඇත. එසේම මෙසේ පර්යේෂණවල නිර්දේශ මත වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට විසඳුම් ලබා දීමට කටයුතු ඉටු කල හැක.

(v) පිළිතුර ඉහත (iv) මගින් ඉදිරිපත් කර ඇත.

(vi) වර්තමානයේ සමීක්ෂණය සහ සම්බන්ධීකරණය සඳහා නිලධාරියෙකු පත් කර ඇත. ඇයගේ සේවය සක්‍රීයව ලබා ගැනීම තුළින් ඉදිරියේදී මෙම අඩුපාඩු අවම කර ගැනීමට හැකි වනු ඇත.

(vii) මෙම සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදීම සඳහා වෙනත් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ ක්‍රම හඳුන්වා ඇති ක්‍රමවේද හා ක්‍රියාවේ යෙදවීමේදී ඇතිවූ අපහසුතා හා දුර්වලතා පිළිබඳ ප්‍රථමයෙන් අධ්‍යයන කළ යුතුය. ඒ අනුව කරුණු සලකා බලා සාර්ථක ක්‍රමයක්

හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා වන ක්‍රමවේදය සකස් කිරීම දැනට සිදු කරන අතර ඉදිරි වසර කීපය තුළ සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය හඳුන්වා දීමට ක්‍රියා කරනු ඇත.

(ix) මේ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති අතර අඩු ආදායම්ලාභීන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර පිණිස ස්වයං රැකියා ආධාර ලබා දිම දැනට ක්‍රියාත්මක වේ.

(x) මේ පිළිබඳව තොරතුරු එක් රැස් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

## 4.2 *කළමනාකරණ අකාර්යක්ෂමතා*

(අ) බඳවා ගැනීමේ පටිපාටියට අනුව රියදුරු බඳවාගැනීමේදී බඳවා ගැනීම් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම් සිදු කර ඇත. මෙම රියදුරුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් කම්කරු විනිශ්ච සභාවේ නඩුවක් ගොනු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නීති සහය ලබා ගැනීමට කටයුතු කරන ලදී. එහිදී නීතිඥ මහතුන්ගේ සහය අපවෙත ලබා දුන්නද ඔවුන්ගේ කාර්ය පථයන් සුවිශාල වන හෙයින් වරින් වර එක් එක් නීතිඥ මහතුන් මෙම නඩුව සඳහා පත් කර තිබුණි. එම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ගෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා වෙනත් දිනයක් වෙන් කර දෙන ලෙස ගරු අධිකරණයෙන් එම නීතිඥයින් ඉල්ලීම් කල නිසා මෙම නීතිමය කාර්ය සඳහා සැලකිය යුතු කාලයක් ගත වූ අතර, මේ නිසා විත්තිපාර්ශවයට යම් අගතියක් සිදු වුනි නම් එය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට පාලනය කල නොහැක්කක් වූ බව සඳහන් කරමි. කම්කරු විනිශ්ච සභාව සිදු වූ අගතිය සම්බන්ධයෙන් විත්ති පාර්ශවයට රු. 10,000/- මුදලක් ගෙවීම කරන ලෙස නියෝග කල බැවින් මෙම මුදල ගෙවීමට සිදු වූ අතර, මෙය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ හෝ කාර්ය ක්‍රමවේදයන්හි ප්‍රමාදයන් හේතුවෙන් සිදු නොවූවක් වන බවත්, ගරු විනිශ්චය අධිකරණයේ නියෝගවලට යටත්ව මෙම ගෙවීම සිදු කිරීමට සිදු වූ බවත් කාරුණිකව දැනුම් දෙමි.

මෙම අධිකරණ ක්‍රියාවලියේදී සියළුම සැසි වාර සඳහා පැමිණිලි පක්ෂය නියෝජනය කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු නම් කළ බලයලත් නියෝජිතයෙක් සෑම දිනකම සහභාගි වූ බව වැඩිදුරටත් සඳහන් කරමි.

(ආ) අදාල දේපල මැනීම් කර ඔප්පුව ලබා ගැනීමට හැකි වන පරිදි ඉඩම් අත්කර ගැනීමේ මූලික පියවර මේ වන විට ආරම්භ කර ඇත.

(ඇ) සේවය අවසන් කරන ලද රියදුරු එම්. ඒ. ඩී. ඒ. නිශාන්ත පෙරේරා මයාගෙන් රජයට අයවිය යුතු උත්සව අත්තිකාරම් රු. 2500 ක ණය මුදල සහ අනෙකුත් ණය මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇත.

4.3 *මෙහෙයුම් අකාර්යක්ෂමතා*

වැඩිහිටි සුබසාධනය සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට බස්රථයක් ලබා ගැනීමට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට යෝජනාවක් ඉදිරිපත් වී අනුමැතිය ලැබී තිබුණි. නමුත් මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන මාරුකිරීම් සිදු කළ යුතුව තිබුණු හෙයින් භාණ්ඩාගාරයෙන් එකඟතාවය විමසා ඇත. අදාල එකඟතාවය වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයෙන් නොලැබුණු හෙයින් බලාපොරොත්තු වූ වැඩිහිටි සුබසාධන කටයුත්ත මෙම වර්ෂයේදී ඉටු කිරීමට නොහැකි විය. නමුත් 2015 වර්ෂයේදී මේ පිළිබඳව ඵලදායී පියවරක් ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

4.4 *ආර්ථික නොවූ ගනුදෙනු*

(අ) 2008.04.02 දින මිලදී ගන්නා ලද සෝනි වර්ගයේ රූපවාහිනී යන්ත්‍රය අවුරුදු 06ක් පැරණි රූපවාහිනියකි. නමුත් මෙම කාර්යාලය නව මුහුණුවරකින් නවීකරණය කරන ලදුව එවැනි රූපවාහිනී යන්ත්‍රයක් ස්ථාන ගත කර තැබිය හැකි යෝග්‍ය ස්ථානයක් නොවීය. නමුත් මෙම කාර්යාලයට පැමිණෙන විවිධ මානසික පීඩා සහිත වැඩිහිටියන් සහ නඩත්තු මණ්ඩලය වෙත පැමිණෙන වැඩිහිටියන්ගේ මානසික සුවය උදෙසා රූපවාහිනියක් කාර්යාලය තුළ සවි කිරීම යෝග්‍ය බව හැඟී ගිය හෙයින් නව පෙනුමකට සරිලන ආකාරයේ රූපවාහිනී යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

(ආ) කතරගම වැඩිහිටි නිවාසයේ සහ කතරගම සංචාරක නිවාසයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කොට වාර්තාව නියමිත දිනට පෙර භාර දීමට කටයුතු කිරීම සඳහා නියෝග කර තිබුණි. 2014.01.09 දින රාජකාරී අවසන් වී ප.ව 4.30ට භාණ්ඩ සමීක්ෂණය සඳහා කතරගම යාමට පිටත් විය. ඒ වන විට කතරගම සංචාරක නිවාසයේ අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පැවති නිසා කාර්යය මණ්ඩලයට නවාතැන් පහසුකම් ලබා ගැනීමට අපහසු බැවින් දින 1 ½ වැනි කෙටි කාලයක් තුළදී වැඩි පිරිසක් සේවයේ යොදවා එම කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ විසින් තීරණය කරන ලදී. ඒ අනුව සහකාර අධ්‍යක්ෂ වසන්තිකා ඩයස් මිය අධීක්ෂණ නිලධාරියා වශයෙනුත් එම මණ්ඩලයේ සභාපති වශයෙන් පරිපාලන නිලධාරී ඩබ්. අසෝකා නන්දසිරි මිය යොදවන ලදී. එහි සාමාජිකයින් වශයෙන් සම්පත් මධ්‍යස්ථානයට නිලධාරීන් දෙදෙනෙකු ද වැඩිහිටි නිවාසයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා නිලධාරීන් තිදෙනෙකු යොදවන

ලදී. ඊට අමතරව රියදුරු සහ කාර්යාල සහයක දෙදෙනෙකු ද වශයෙන් යෙදවීමට කටයුතු කරන ලදී.

4.5 ලේඛන පවත්වාගෙන නොයෑම

(අ) ඉදිරියේදී පරිත්‍යාග ලේඛණයට ඇතුලත් කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ආ) තක්සේරු වටිනාකම් ඉදිරිපත් කර නොමැති දේපලවල නිවැරදි තක්සේරු වටිනාකම දැනුම් දෙන ලෙස ප්‍රධාන කත්සේරුකරු සහ ප්‍රාදේශීය තක්සේරු නිලධාරීන් වෙත දැනුම් දී ඇති අතර තක්සේරු වටිනාකම් ලද පසු ලේඛණවල ඇතුළත් කිරීමට කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. එසේම දැනටමත් දේපල වටිනාකම් සහිත ඔප්පුවල තොරතුරු විධිපත් පරිදි පරිත්‍යාග ලේඛණවල ඇතුළත් කිරීමටද උපදෙස් ලබා දී ඇත.

(ඇ) ලෙජරයේ විවිධ තැන්පත් ගිණුමක් පවත්වාගත යුතු බව විගණනයෙන් පෙන්වා දී ඇති හෙයින් ඉදිරියේදී එසේ කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

4.6 වත්කම් කළමනාකරණය

(අ) සේප්පුවේ වැඩිපුර පැවති මුදල විගණනය මගින් හඳුනා ගැනීමෙන් පසු එය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.

(ආ) මින් ඉදිරියේදී විධිමත් පරිදි පරිගණක ලබා ගැනීමෙන් පසුව ගෙවීම් සිදු කල යුතු බවට අදාල නිලධාරීන් වෙත උපදෙස් දී ඇත. ශාඛාවේ දැනට ඉදිරිව ඇති පරිගණක කඩිනමින් නියමිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කිරීමට මේ වන විට කටයුතු සලසා ඇත.

(ඇ) 2014.12.31 දින වන විට සමාජ සේවා අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් පමණක් සේවා අවශ්‍යතාවය මත සභාවේ කටයුතුවල යොදවා තිබූ අතර එම රථ දෙකම මේ වන විට නැවත අමාත්‍යාංශය වෙත බාර දී ඇත.

## 4.7 කාර්ය මණ්ඩලය

පුරප්පාඩු පිරවීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය වෙත සහ ගණකාධිකාරී සේවා අංශය වෙත වරින් වර ලිපි යවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර සඳහා නිලධාරියෙක් 2015.04.10 දින වන විට රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය මගින් පත්කර එවා ඇත. ඉතිරි මාණ්ඩලික පුරප්පාඩු 2015 අවසන් වීමට පෙර පිරවීමට පියවර ගන්නා බව රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් වාචිකව දැනුම් දී ඇත.

මාණ්ඩලික නොවන සියළු තනතුරු පුරප්පාඩු මේ වන විට පිරවීමට පියවර ගෙන ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2013 වර්ෂයට අදාල අවසන් ගිණුම සකස් කිරිමේ දි සිදු වූ වැරදි අඩුපාඩු නිවැරදි කිරිම් සිදු කිරිම නිසා නියමිත කාලයටම 2014 වර්ෂයේ අවසන් ගිණුම ඉදිරිපත් කිරිමට නොහැකි වූ අතර, නියමිත දිනට ගිණුම් වාර්තා විගනනය සඳහා ඉදිරිපත් කිරිමට මින් ඉදිරියට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.

## 5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැර වීම.

(i) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම වර්ෂය මුලදී සිදු කරන ලදී. නමුත් ප්‍රසම්පාදන සැලැස්ම නැවත සංශෝධනය කිරීමට හැකියාවක් නොමැත.

එසේ වුවද සේවා අවශ්‍යතා අනුව, එනම් සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි මෙම ආයතනය මගින් සිදු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් මාධ්‍ය දැනුවත් කිරීම පිණිස ඒකකයක් වෙනම පිහිටුවන ලදී. ඒ අනුව අදාල කාර්යයන්හි ඡායාරූප ගත කිරීම පිණිස කැමරාවක අවශ්‍යතාවය පැනනැගුන හෙයින් ද, සඟරා ආදියෙහි ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය වන ඡායාරූප ගැනීමට ද කැමරාවක් තිබීමේ අවශ්‍යතාවය දැඩිව පෙන්නුම් කළ හෙයින් සේවා අවශ්‍යතාවය මත මෙම මිලදී ගැනීම් සිදු කර ඇත.

(ii) ඉහත 4.4 (අ) පිළිතුරු මගින් ඉදිරිපත් කර ඇත.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2014 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවීම වර්ෂයේ ජූනි මස දක්වා කල්ගත වීම හේතුවෙන් වර්ෂය තුළ මෙම කමිටුව රැස්විය යුතු වාර ගණන රැස්වීමට නොහැකි වූ බව කාරුණිකව දැනුම් දෙමි.

### 5.5 අයවැය පාලනය

2013 වර්ෂයේ ඇස්තමේන්තු ඉදිරිපත් කරමින් ඉල්ලා තිබූ ප්‍රතිපාදනය 2014 වර්ෂයේදී නොලැබුණු අතර 2014 වර්ෂයේ ප්‍රතිපාදන ලෙස වෙන් වූ ප්‍රතිපාදනයෙන්ද අක්මුදල් ලෙස වෙන් වූයේ තවත් අවම මුදලකි. එම අක්මුදල් ද කාර්තු වශයෙන් වරින් වර ලැබීම හේතුවෙන් අයවැය ලේඛණයේ ආදායම් වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර වෙනසක් පැවතිණි. පූර්ව මුදල් වර්ෂයේදී ද දෙසැම්බර් මස අවසාන වනතුරු අක්මුදල් නොලැබීම හේතුවෙන් උපචිත වියදම් දැරීමට සිදු වූ හෙයින් 2014 වර්ෂයේ දෙසැම්බර් වන විට අක්මුදල් ප්‍රමාණය නොලැබේ යැයි උපකල්පනය කරමින් වියදම් සීමා කළ අතර අනපේක්ෂිතව 2014 දෙසැම්බර් 19, 20 සහ 26 දිනවලදී අක්මුදල් ලැබුණු හෙයින් මෙම විචලනය සිදු වී ඇති බව තවදුරටත් ප්‍රකාශ කරමි.

### 6. පද්ධති හා පාලන

පාලක සභාවේ අවධානයට යොමු කරමින් විධිමත් ලෙඛණ පවත්වාගෙන යාමටත් ඒ තුළ පද්ධති පාලන ක්‍රියාවලිය සාර්ථකව ඉටු කිරීමටත් අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත.

සුවින්ද එස්. සිංගප්පුලි

අධ්‍යක්ෂ

සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
சமூக சேவைகள், நலன்புரி மற்றும் கால்நடை வளர்ப்பு அபிவிருத்தி அமைச்சு
Ministry of Social Services, Welfare & Livestock Development

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | NSE/FC3/GENERAL/QUIRES | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2015.09. 01 |

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව.

**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

ඔබ විසින් ඉදිරිපත් කර තිබූ අංක එල්එස්/බී/එන්සීඊ/1/14/06 හා 2015.07.29 දිනැති විගණකාධිපති වාර්තාවේ 2.5.4 කොටසෙහි (ඉ) මගින් ඉදිරිපත් කර තිබූ විගණන විමසුම සඳහා වන පිළිතුර පහත පරිදි සංශෝධනය කරමි.

වවුචර්පත් අංක 438 මගින් රු. 5000 බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 සඳහා වැඩිහිටි දින උත්සවයේ ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් රු. 1,655,000 ක මුදලක් ලබා දුන් අතර ඒ සඳහා ලදුපත් 75ක් පමණ ලැබී ඇත.

ලදුපත් එවා නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි යවා ලදුපත් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

සුවින්ද එස්. සිංගප්පුලි
අධ්‍යක්ෂ

පිටපත :- ලේකම්, සමාජ සේවා සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி ,தொகுதி D, செத்சிறிபாய - கட்டம் II, பத்திரமுல்லை
Address : 2nd Floor , Block D, Sethsiripaya - II Stage, Baththaramulla.
ඊ-මේල් / ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2187045
කාර්යාලය / அலுவலகம் / Office : 3094543
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015